# සති පාසල සඳහා කාර්ය පත්‍රිකාව

1. පන්තිය - 8 ශ්‍රේණිය   විෂයය - සිංහල   අදාළ සතිය - නොවැම්බර් 3 සතිය

2. පාඩම් හෝ ඒකකය - 23   සවන් යොමමු, කතා කරමු, ලියුම් ලියමු (මාතෘකානුකූල කථා / රාජකාරි ලිපි)

3. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන් -

   I. පාඩම කියවා මාතෘකානුකූල කථාවක තිබිය යුතු ලක්ෂණ හඳුනා ගන්න.
   II. ඒ අනුව ඔබේ වැඩිහිටියන් ඉදිරියේ ඔබ කැමති මාතෘකා අනුව කතා කරන්න.
   III. පාඩම කියවා රාජකාරි ලිපියක් තුළ තිබිය යුතු ආකෘතිය හඳුනා ගන්න.
   IV. ඒ අනුව ඔබේ පන්ති භාර ගුරුතුමියට ලිපියක් ලියන්න.
   V. මාතෘකානුකූල කතාවලට තවදුරටත් සවන් දෙන්න.
   VI. රාජකාරි ලිපි සොයාගෙන කියවා තවදුරත් එහි ලක්ෂණ තහවුරු කර ගන්න.
   VII. e තක්සලාව, e නැණ පියස, ගුරු ගෙදර, DP Education හෝ පාසල් වෙබ් අඩවි හෝ මුද්‍රිත පොත්පත් ආදි ඉගෙනුම් ආධාරක මඟින් පාඩමට අදාළ ඉගැන්වීම්, පාඩම් ලබා ගෙන ඉගෙනගන්න.

4. ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කර ගත හැකි පොත්පත්,Website, LMS පාඩම් හා ඉගෙනුම් ආධාරක

   I. e නැණපියස -
      - https://www.enenapiyasa.lk/lms/mod/page/view.php?id=10993

   II. වෙනත් - යූ ටියුබ්
      a. (381) Grade 8 සිංහල | 2020 11 30 Recording | 23 පාඩම - සවන් යොමමු, කතා කරමු, ලියුම් ලියමු - YouTube
      b. https://drive.google.com/file/d/19eZ_a9Xwf1r1-fxM3584MuX9f7zVUXIi/view
      c. https://drive.google.com/file/d/18AXkDad0FAoB3SE00IIA7hAyHBClJGOf/view

   III. අතිරේක පොත් / සඟරා -
      a. සිංහල ප්‍රායෝගික ලේඛන - රත්න කොඩිකාර
      b. සිංහල භාෂාව හා සාහිත්‍ය ප්‍රායෝගික ලේඛන - නයන තිලක් රත්නායක

5. මෙම පාඩම තුළින් ලබා ගත හැකි ඉගෙනුම් පල
   I. මාතෘකාවකට අදාළ ව කථා කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.
   II. කථන කුසලතා ප්‍රදර්ශනය කරමින් කතා කරයි.
   III. රාජකාරි ලිපියක මූලිකාංග හඳුනාගෙන රාජකාරි ලිපි ලියයි.
   IV. කථන කුසලතාව වර්ධනය කර ගැනීමෙන් තම පෞරුෂය වැඩෙන බව හඳුනා ගනියි.
   V. එදිනෙදා සමාජය තුළ ප්‍රායෝගිකව කටයුතු කිරීමේදී මෙම අංග වල අවශ්‍යතාව හඳුනා ගනියි.

6. ඇගයීම හා තක්සේරුව
   I. පහත මාතෘකා යටතේ ඔබේ වැඩිහිටියන් ඉදිරියේ කථා කරන්න.
      - පරිසරය
      - ජාතික සම්පත් සුරැකීම
      - ජාතික වීරවරයෝ
      - සාරධර්ම සුරැකීම
      - මත් උවදුර පිටු දැකීම

   II. රාජකාරි ලිපියක මූලිකාංග ආකෘතියක් ඇඳ එහි සලකුණු කරන්න.
   III. පරිගණක ආශ්‍රිත රාජකාරි ලිපියක ආකෘතිය ද සටහන් කරන්න.
   IV. මේ දිනවල පවතින කොවිඩ් 19 ආපදාව ඔබ ප්‍රදේශයේ බහුලව පවතින්නේ යැයි සිතා ඒ පිළිබඳ අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් ඉල්ලමින් ප්‍රදේශය භාර මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා වෙත ලිපියක් ලියන්න.